www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කොසෝවෙහි ස්වාධීනත්වය, කලින් සෝවියට් සංගමයට අයත්ව තිබූ දේශයන්හි නව ගැටුම් අවුලුවිය හැකියි

## Kosovan independence could ignite new conflicts in territories of former Soviet Union

විලැඩිමීර් වොල්කොව් විසිනි
2008 පෙබරවාරි 29

එක්සත් ජනපදය හා ජර්මනිය, ප්‍රන්සය, මහා බ්‍රිතාන්‍ය හා ඉතාලිය වැනි බටහිර යුරෝපා රටවල් විසින් සහාය දෙන ලද පෙබරවාරි 17 වැනි දින කොසෝවෙහි ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම කලින් සෝවියට් සංගමයට අයත්වූ ජාතීන් අතර සබඳතා ප්‍රකෝප කිරීමට තර්ජනය කරයි.

1990 ගනන්වල සිට අක්‍රියව තිබූ ගැටුම් ගනනාවක් -- ජෝර්ජියාවෙහි ඇබ්කාසියා හා දකුනු දෙසෙහි ඔසේටියාව, මොල්ඩෝවාහි ප්‍රිඩ්නෙස්ට්‍රොවි, අසර්බයිජාන්හි නගොර්නෝ-කරබාක් -- නැවත වරක් අවුලුවිය හැක. එහි ප්‍රතිඵලය වනුයේ අනපේක්ෂිත ආදීනව ඇතිවන හමුදාමය ක්‍රියාකාරකම්ය.

ඒ සමග ම, ක්‍රෙම්ලිනයේ බලය ජනාධිපති විලැඩිමීර් පුටින්ගෙන් ඔහුගේ අනුප්‍රාප්තික ඩමිට්‍රි මෙඩ්වෙදෙව්ට පැවරීමේ අපේක්ෂිත ප්‍රතිඵලයට කොසෝවෙහි ස්වාධීනත්වය හරස්වෙයි. ජාත්‍යන්තර සබඳතාවන්හි රුසියාවේ වර්ධනය වන භූමිකාවක පසුතලයක් තුල, මේ බලය පැවරීමේ අත්‍යවශ්‍ය අංගයක් වනුයේ බටහිර රටවල් සමග ආතතීන් සැහැල්ලු වීමය.

සර්බියාවෙන් කොසෝවෝව වෙන් වීම හෙලාදැකීම තුලින් බටහිර රටවල් අරබයා මිත්‍රශීලී ඉඟි දැක්වීමේ සම්භාව්‍යතාවය ක්‍රෙම්ලින්හි දේශපාලනඥයින් කැපී පෙනෙන ලෙස සීමා කොට ඇත. ඔවුන්ගේ දේශන ජාතිකවාදී සහ යුදකාමී අලංකාරෝක්තීන්ට ප්‍රමුඛත්වය දෙන ඒවා වනු ඇතැයි කෙනෙකුට උපකල්පනය කල හැකිය. මෙය ඇරඹුනේ 2007 පෙබරවාරියේ පුටින් විසින් කරන ලද දේශනයෙනි. රුසියාව හා බටහිර රටවල් අතර සබඳතාවන් වඩා සුහද වනු ඇතැයි අපේක්ෂා කල රුසියාවේ ලිබරල්වාදීන්ගේ බලාපොරොත්තු එතුලින් කඩවිය.

කොසෝවෝව ස්වාධීනත්වය ප්‍රකාශ කිරීමට පසු දින, එනම් ඔක්තෝබර් 18 වැනි දින, රාජ්‍ය ඩූමා සභාව හා රුසියානු ඒකාබද්ධ සංගම් සභාව ඒකාබද්ධ යෝජනාවක් සම්මත කර ගත්හ. එමගින් කියැවුනේ " ජාත්‍යන්තර නීතියේ සම්මතයන් පාගාදමා ඇති" බවත් "ඇත්ත වශයෙන්ම, එක්සත් ජාතීන්ගේ සියලු මූලධර්මයන් කනපිටහරවා ඇති" බවත් ය.

මේ ප්‍රකාශය ගැන කරුනු දක්වමින් ඒකාබද්ධ සංගම් සභාවේ කථානායක සර්ගෙයි මිරොනොව් තව දුරටත් කියා සිටියේ සෝවියට් සංගමය බිඳවැටීමෙන් අනතුරුව ස්වාධීනත්වය ප්‍රකාශ කල පිලිනොගත් දේශයන් අරබයා සිය ආකල්පය සමාලෝචනය කිරීමට රුසියාව බැඳී සිටින බව ය. මොස්කව් විසින් එම රටවල් නිල වශයෙන් පිලිගැනීමට ඉඩ ඇති බවත් එමගින් ඉඟි කෙරුනි.

රුසියාවෙන් ඊලඟ ප්‍රකාශන රැල්ල මතු වූයේ පෙබරවාරි 22 දා ය. ඒ කලින් දින සවස් වරුවේ බෙල්ග්‍රේඩ්හි 200,000ක ජනකායක් විසින් පවත්වන ලද රැලිය එහි ඇමරිකානු තානාපති කාර්යාලය වෙත එල්ල කරන ලද ප්‍රහාරයකින් අවසන් වීමෙන් අනතුරුව ය.

"යුරෝපා සංගමයෙහි හෝ උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයෙහි හෙවත් නේටෝවෙහි ක්‍රියාකාරකම් මගින් කොසෝවෝව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ යෝජනාව උල්ලංඝනය වන්නේ නම්, එම කලාපයෙහි හමුදාමය වශයෙන් මැදිහත් වීමේ සම්භාව්‍යතාව රුසියාව බැහැර නොකරන" බව නේටෝවෙහි රුසියාවේ නිත්‍ය නියෝජිත ඩමිට්‍රි රොගොසින් ප්‍රකාශ කලේ ය. ඊට අමතරව, කොසෝවෝවෙහි ස්වාධීනත්වය පිලිගැනීම පිලිබඳ ක්‍රියාවලියට මුදල් සපයන ලද්දේ ප්‍රදේශය මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ මාෆියාව විසින් යයි ද රොගොසින් ඉඟි කලේ ය. මේ ප්‍රකාශවලට වොෂින්ටනයෙන් නිල වශයෙන් දෝෂාරෝපනයක් මතු කෙරින.

මේ පිලිබඳව රුසියානු ජනාධිපති පුටින් ද කරුනු දැක්වී ය. ඒ සඳහා වේදිකාවක් වශයෙන් ඔහු තෝරා ගත්තේ මොස්කව්හි පවත්වන ලද ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මන්ඩලයෙහි (සීඅයිඑස්) නිල නොවන නායක සමුලුවකි. මෙහි මෑත වසරවල දී පලමු වතාවට පොදු මන්ඩලයට අයත් රාජ්‍යයන් දොලහේ ජනාධිපතිවරු සියලුදෙනාම එක් රැස් වූහ. (බෝල්ටික් මුහුද වටා රටවල් හැරුනු විට සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයට අයත් වූ කලින් තිබූ සමූහාන්ඩු මේ රැස්වීමට ඇතුලුවිය. මේ සම්බන්ධයෙන් යුක්රේනියානු ජනාධිපති වික්ටර් යුෂ්චෙන්කෝ,

ජෝර්ජියානු ජනාධිපති මිකේල් සාකෂ්විලි හා ටර්ක්මෙන්හි ජනාධිපති ගුර්බන්ගුලා බර්ඩිමුඛාම්මොඩොව් මොස්කව් නගරයට පැමිනීම ගැන පුවත්පත් ප්‍රකාශන විශේෂ අවධානය යොමු කෙරින).

රැස්වීමෙහි දී පුටින් මෙසේ පැවසී යඃ "කොසෝවෝ පූර්වාදර්ශය නරක එකකි. හරාත්මකව, දශක ගනන් තුල නොව, ශතවර්ෂ ගනන් තුල, වර්ධනය වී ඇති ජාත්‍යන්තර සබඳතා පිලිබඳව මුලු පද්ධතියම එය බිඳ දමයි. එය පිටුපසින් අනපේක්ෂිත ප්‍රතිඵල වැලක් ඇදී එන බවට සැකයක් තිබිය නොහැක."

සර්බියාවෙන් කොසෝවෝව ස්වාධීනවීම පිලිගත් රාජ්‍යයන් තම ක්‍රියාවන්වල ගම්‍යයන් සැලකිල්ලට ගෙන නැතැයි පුටින් තව දුරටත් කියා සිටියේ ය. "සියලු කරුනු සලකා බැලීමෙන් පසු නිගමනය කල හැක්කේ මෙය දෙපැත්ත කැපෙන කඩුවක් බවත් එක්තරා අවස්ථාවකදී ඔවුන්ට එහි ආදීනව විඳීමට සිදුවිය හැකි බවත්" ඔහු කීය.

බටහිර රටවල ක්‍රියාවන් සම්බන්ධයෙන් රුසියානු නායකයින්ගේ විරෝධතාවන්හි නෛතික සාධාරනීකරනය කෙසේ වුවද, රුසියානු ස්ථාවරය අතිශයින්ම කුහක ය.

පසුගිය වසර ගනනාව තුල, රුසියානු නිල ප්‍රචාරක කටයුතු කේන්ද්‍රගත වූයේ මානව අයිතීන් සහ ප්‍රජාතන්ත්‍රීය නිදහස පිලිබඳ සංකල්පයන් විවේචනය කිරීම මත ය. ඒවා රුසියාවට අදාල නොවන, බටහිර ශිෂ්ටාචාරයෙහි ප්‍රතිඵල ලෙස ප්‍රකාශ කෙරුනි.

ක්‍රෙම්ලිනයෙහි ප්‍රචාරකයින් අධිරාජ්‍යමය ශ්‍රෙෂ්ඨත්වය හා ප්‍රබුද්ධ ආධිපත්‍යවාදය ('ස්වෛරී ප්‍රජාතන්ත්‍රවාදය') පිලිබඳ මත දිගටම ඉදිරිපත් කර ඇත. ක්‍රියාත්මක වීමේ දී මෙය ප්‍රකාශ වන්නේ ඕනෑම විරෝධතාවක් මර්දනය කිරීම, පුලුල් පරිමානයේ මැතිවරන වංචා කිරීම හා සිවිල් හා දේශපාලන අයිතීන් සීමා කිරීමට පියවර ගැනීම තුලිනි.

ක්‍රෙම්ලිනයෙහි උත්තරීතර බලය පුටින්ගෙන් මෙඩ්වෙඩෙව්ට පැවරීමේ ස්වභාවය ම මූලික ප්‍රජාතන්ත්‍රීය ක්‍රියා පටිපාටිය නොසලකා හරින සුලුය. පුටින් විසින් නම් කර ඇති "අනුප්‍රාප්තිකයා" ජනාධිපතිධුරය සඳහා අනිකුත් සියලු නාමික අපේක්ෂකයින්ට වඩා ඉහලින් ඔසවා තැබේ.

විදේශ ප්‍රතිපත්ති විශයෙහි ලා, "බලශක්ති අධිරාජ්‍ය" යන මතය ක්‍රෙම්ලිනය සිය අවි ගබඩාවට එකතු කර ඇත. මෙය යටතේ ආර්ථික පීඩනය හා කප්පම් මගින් මොස්කව්හි අවශ්‍යතාවන් සපුරාලනු ලැබේ. යුක්රේනය සමග ගෑස් පිලිබඳ ආරවුල්වලින් පැහැදිලි වන්නේ රුසියානු පාලක ප්‍රභූවේ ස්වයං ප්‍රකාශිත ක්‍රියාමාර්ග හා ආකල්පවලට වඩා එහි සැබෑ ක්‍රියාමාර්ග හා ආකල්පයන් ය.

මේ රාමුව තුල, ජෝර්ජියාව, මොල්ඩෝවාව හා අසර්බයිජානය යන දේශවල පිලිනොගත් ස්වාධීන කලාපවල අයිතීන් ක්‍රෙම්ලිනය විසින් ආරක්ෂා කිරීම මුලුමනින් ම පදනම්වනුයේ සිය භූ-දේශපාලනමය අවශ්‍යතා පවත්වා ගෙන යාමේ අභිලාෂය මතය. සිය අසල්වැසි රාජ්‍යයන් සමග ගනුදෙනුවල දී මේ ස්වාධීන ප්‍රදේශවල තත්වය හා ඉරනම පිලිබඳ ප්‍රශ්නය මොස්කව් දකින්නේ එතරම් සැලකිල්ලට ගත යුත්තක් නොවන ලෙස ය.

රුසියාවෙහි පීඩනය යටතේ, සිය ජනගහනයන්ගෙන් සියයට 80කට අධික ප්‍රතිශතයකට රුසියානු ගමන් බලපත්‍ර සතු ස්වාධීන ප්‍රදේශ වන අබ්කාසියාව හා දකුනු ඔසේටියාව කොසෝවෝහි පූර්වාදර්ශය අනුව යමින් සිය ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් කිසිදු නිශ්චිත නිවේදනයක් කර නොමැත. ඒ වෙනුවට, සිය සිවාධීනත්වය පිලිගන්නා ලෙස ඉල්ලීමක් කරමින් රුසියාවට ස්වාධීන රාජ්‍යවල පොදු මන්ඩලයෙහි (සීඅයිඑස්) අනිකුත් රටවලට හා එක්සත් ජාතීන්ට නුදුරු අනාගතයේ දී ආයාචනයක් ඉදිරිපත් කිරීමේ සිය අභිලාෂය මේ ස්වයංපාලිත ප්‍රදේශ දෙකෙහි ජනාධිපතිවරු පසුගිය සතිය ආරම්භයේ දී ප්‍රකාශ කලහ.

කොසෝවෝව පූර්වාදර්ශයක් ස්ථාපිත කර ඇතැයි ද "කොසෝවෝ තත්වයෙහි සුවිශේෂී ස්වභාවය ගැන කෙනෙකුට කථා කල නොහැකි ය"යි ද රුසියානු අගනුවර දී පවත්වන ලද පුවත්පත් සාකච්ඡාවකදී ප්‍රකාශයක් කරමින් අබ්කාසියාවේ ජනාධිපති සර්ගේ බැගැප්ෂ් කියා සිටියේ ය. කොසෝවෝවට වඩා සිය ස්වාධීනත්වය පිලිගැන්වීමට දකුනු ඔසේටියාවට හා අබ්කාසියාවට වඩාත් බලගතු දේශපාලනමය හා නෛතික පදනම් ඇතැයි දකුනු ඔසේටියාවේ ජනාධිපති එඩුවාඩ් කොකොයිටි අවධාරනය කලේ ය. ජෝර්ජියාවේ මෙම කලාප දෙක මීට වසර 17කට පෙරාතුව සිය ස්වාධීනත්වය ප්‍රකාශ කල බව ඔහු සටහන් කලේ ය.

මේ ස්වයංපාලිත ප්‍රදේශ දෙකෙහි ස්වාධීනත්වය පිලිගැනීමට රුසියාව තීරනය කරනු ඇතැයි යන්න පිලිබඳ විශේෂඥයින් ගනනාවක්ම සැක පහල කොට ඇත. දකුනු ඔසේටියාවේ දේශපාලන තාක්ෂනයන් පිලිබඳ ආයතනයෙහි ඉසොල්ඩා කච්මසෝවා ගැසට් පුවත්පතේ වාර්තාකරුට මෙසේ කියා සිටියේයඃ "මුලු ලොවම කොසෝවෝව පිලිගත්ත ද, රුසියාව අපට සහාය නොවනු ඇත. ජෝර්ජියාව හා ජාත්‍යන්තර ප්‍රජාවට පීඩනය එල්ල කිරීමේ කාර්යයෙහි ලා, රුසියාව අප සැලකිල්ලට ගන්නා නැති තරම් ය. ටිබිලිසිය නේටෝ සංවිධානය සමග සාකච්ඡා පවත්වන විට එය නේටෝ සංවිධානයට ඇතුලුවීම වැලැක්වීමට නොයෙකුත් දේශපාලන බලවේග තුලින් රුසියාව උත්සාහ දරනු ඇත. ඒ

වෙනුවට රුසියාව අප හා අබ්කාසියාව පොරොන්දු වනු ඇත.

"අබ්කාසියාවෙහි හා දකුනු ඔසේටියාවෙහි ස්වාධීනත්වය රුසියාව පිලිගනු ඇතැයි මම නොසිතමි" යි දේශපාලන පර්යේෂන සඳහා වූ මොස්කව් කේන්ද්‍රයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇලෙක්සේයි මකාරින් කීය. "එවැනි අවස්ථාවක, ජාත්‍යන්තර සංවිධානයන්හි රුසියාව පෙනීසිටීම ප්‍රශ්නයට ලක් කෙරෙනු ඇත. මොස්කෝව, සරල ආකාරයට මෙම සමූහාන්ඩුවලට සපයන ඇතැම් ආර්ථික හා සංස්කෘතික ආධාර ශක්තිමත් කොට එතැනින් නවතිනු ඇත."

සීඅයිඑස් හි රටවල් අතුරින් කොසෝවෝවෙහි ස්වාධීනත්වය පිලිගැනීම ප්‍රතික්ෂේප කල රටකි ජෝර්ජියාව. විදේශ කටයුතු පිලිබඳ ජෝර්ජියානු පාර්ලිමේන්තු කමිටුවේ සභාපති, කොන්ස්ටන්ටින් ගබෂ්විලි, කොසෝවෝව සම්බන්ධයෙන් සිය ආන්ඩුවෙහි ස්ථාවරය තහවුරු කලේ ය. අබ්කාසියාවෙහි, දකුනු ඔසේටියාවෙහි හා ප්‍රිඩ්නෙස්ට්‍රොවීහි බෙදුම්වාදී වෙන්වූ දේශවල ස්වාධීනත්වය පිලිගැනීමට, පූර්වාදර්ශ අනුව යමින්, රුසියාව ස්ථිර පියවර ගන්නේ නම් මේ ප්‍රශ්නය ගැන යලි සලකා බැලෙනු ඇත.

මේ වසරේ ජනවාරි 5 දා සකාෂ්විලි ජනාධිපති වශයෙන් යලි තේරී පත්වීමෙන් අනතුරුව, රුසියාව ඉලක්ක කොට ගත් ජෝර්ජියානු නායකයින්ගේ අලංකාරෝක්තීන් සැලකිය යුතු ලෙස මෘදු විය. මොස්කව් සමග සහයෝගිතාව යලි වෙනස් කල නොහැකි වීම, වීසා බලපත්‍ර සඳහා සුදුසුකම් ලිහිල් කිරීමේ අවශ්‍යතාව, වයින් සම්බන්ධයෙන් සම්බාධක ඉවත් කිරීම් හා ප්‍රවාහන සීමාවන් ඉවත් කිරීම ගැන හඬ නැගීම ටිබිලිසිය ඇරඹීය.

ජෝර්ජියාව අරබයා රුසියානු ඉල්ලීම් සකස් කරන ලද්දේ රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශය තුල සීඅයිඑස් රටවල ප්‍රධානියා වන අන්ද්‍රොයි කොලින් විසිනි. "අප සමග සබඳතා සාමාන්‍ය තත්වයට ගෙන ඒමට සූදානම ජෝර්ජියාව නිශ්චිත පියවර කිහිපයක් ගැනීම තුලින් පෙන්විය යුතු ය"යි ඔහු කොමර්සන්ට් පුවත්පතට කීය. මේ කොන්දේසි අතර පහත සඳහන් ඒවා ද විය: ලෝක වෙලඳ සංවිධානය සමග ගොනු කරන ලද විරෝධතා ඉල්ලා අස් කර ගැනීම, ටිබිලිසියෙහි රුසියානු පාසලක් ඇරඹීම, හා ඉතාම වැදගත් කොන්දේසිය වන, ජෝර්ජියානු දේශය තුල විදේශ හමුදා කඳවුරු පිහිටුවීම තහනම් කෙරෙන නීති සම්පාදනය කිරීම.

"අප කඳවුරු ජෝර්ජියාවෙන් ඉවත් කර ගන්නා ලද්දේ නිශ්චිතව ම, මෙතෙක් ඉටු කොට නැති, මේ පොරොන්දු මත ය. එම නිසා, නේටෝවට ඇතුලුවීමේ ජෝර්ජියාවේ අභිප්‍රාව ඇති සංදර්භයක් තුල විදේශීය හටකායන් ඇතුලු කර නොගැනීම පිලිබඳ නීති සම්මත කර ගැනීම අපට අතිශයින් වැදගත්වේ" යයි අන්ද්‍රෙයි කෙලින් කීය.

ප්‍රිඩ්නෙස්ට්‍රොවී සම්බන්ධයෙන් මොස්කෝව අනුගමනය කර ඇත්තේ ඒ හා සමාන ප්‍රායෝගික ස්ථාවරයකි. මොල්ඩෝවාව සමග ආර්ථික සබඳතා අතින් වඩාත් මනාප වූ සැලකිල්ලක් දැක්වීම හා කොසෝවෝ පිලිබඳ ප්‍රශ්නයෙහි ලා මොල්ඩෝවාවේ සහාය ලැබීම වෙනුවට ප්‍රිඩ්නෙස්ට්‍රොවීහි තත්වය පිලිබඳ සැලකිය යුතු වාසි ලබා දී එහි ස්වාධීනත්වය පිලිබඳ ප්‍රශ්නය අවසන් කිරීමට රුසියාව සූදානම්ව සිටී.

පසුගිය සතියෙහි මොල්ඩෝවාවෙහි අගමැති වැසිලි තාර්පයෙව් මොස්කව්හි සංචාරයක යෙදුනි. ඔහු සමග හමුවක දී රුසියානු අගමැති වික්ටර් සුබ්කොව් මෙසේ ප්‍රකාශ කර සිටී: "මොල්ඩෝවාවේ භෞමික ඒකාග්‍රතාවට රුසියාව සහාය දක්වයි. මොල්ඩෝවා දේශය මත ප්‍රිඩ්නෙස්ට්‍රොවීහි ප්‍රශ්නය විසඳී නැත."

රුසියාවේ යෝධ බලශක්ති ආයතනය වන ගෑස්ප්‍රොම් මොල්ඩෝවාවෙහි ස්වාභාවික ගෑස් ඇති ස්ථාන ගවේෂනය කරනු ඇතැයි අගමැතිවරුන් දෙදෙනාගේ රැස්වීමක දී ගිවිස ගත්හ. මොල්ඩෝවා ගෑස් සමාගමේ සියයට පනහකුත් එක කොටසක පාලනය දැනටමත් ගෑස්ප්‍රොම් සතුය. එහි අභිප්‍රාය වන්නේ තම කොටස් ප්‍රතිශතය සියයට 80ක ප්‍රතිශතයක් දක්වා වැඩි කර ගැනීම ය. එයට හිලව් වශයෙන් අපේක්ෂිත කොටස් භාරගැනීම ද බැහැර කල නොහැක. රුසියාවෙන් සපයන ලද ගෑස් සඳහා දැනට කිෂිනෙව් හා තිරාස්පොල්හි එය දැනට ඩොලර් බිලියන් 2කට ආසන්න ප්‍රමානයකට නැග ඇත.

මොල්ඩෝවාවට එරෙහිව 2006 වසන්ත සමයෙහි පනවන ලද ආර්ථික සම්බාධක රුසියාව නොවැම්බරයේ සිට ලිහිල් කර ඇත. සම්ප්‍රදායිකව සිය නිමැවුම් රුසියාවට අලෙවි කල මොල්ඩෝවාවේ වයින් නිපදවන්නන්ට මෙහි බලපෑම පහසුවෙන් දැනෙන්නක් විය.

ප්‍රිඩ්නෙස්ට්‍රොවී ප්‍රශ්නය විසඳනුයේ 5+2 යන රීතිය මත පදනම්ව බව පෙනී යයි: එනම්, මොල්ඩෝවාව, ප්‍රිඩ්නෙස්ට්‍රොවී, රුසියාව, යුක්රේනය හා යුරෝපයේ ආරක්ෂාව හා සහයෝගිතාව පිලිබඳ සංවිධානයෙහි මැදිහත්කරුවන් එක්සත් ජනපදයෙහි හා යුරෝපා සංගමයේ නිරීක්ෂකයින් මේ ක්‍රියාවලිය තුලින් ප්‍රිඩ්නෙස්ට්‍රොවීයට විශේෂ තත්වයක් ඉස්මතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය, ජාත්‍යන්තරව පිලිගත් මායිම් ඇතුලත මොල්ඩෝවියාවේ ස්වෛරී භාවය හා භෞමික ඒකාග්‍රතාව ආරක්ෂා කරනු ඇත.

මෝල්ඩෝවාව, කොසෝවෝව විසින් ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම දැඩිලෙස හෙලාදුටුවේය.

සිය රට "කවරදාකවත් කොසෝවෝවෙහි ස්වාධීනත්වය පිලිනොගනු ඇතැ"යි ජනාධිපති ව්ලැඩිමර් වොරොනික් කියා සිටියේ ය. කොසෝවෝවෙහි පූර්වාදර්ශය "යුරෝපයෙහි අස්ථාවර කිරීමේ සාධකයක් " ලෙසත් "ගැටුම් ඇති සියලු කලාපවල බෙදුම්වාදී මනෝභාවයන් ක්‍රියාත්මක කරවීමේ භයානක උත්තේජකයක්" ලෙසත් හඳුන්වමින් නිලධාරියෙකු වූ කිෂිනෙව් ප්‍රකාශයක් බෙදාහැරී ය.

කොසෝවෝව පිලිගැනීමට එරෙහිව හඬනැගූ සීඅයිඑස් හි අනිකුත් රටවල් වූයේ අසර්බයිජානය, බෙලෝරුසියාව හා කර්ගිසියාවයි. දැනට යුක්රේනියාව, ටර්ක්මේනියාව හා උස්බෙකිස්තානය මේ පිලිබඳව ස්ථාවරයක් ගෙන නැත.

පලමුව කොසෝවෝව හා ඊලඟට කරබාක් පිලිගැනීමට පක්ෂපාතීව හඬ නැගෙන නමුදු පැහැදිලිව ම මොස්කව්හි පීඩනයට යටත්ව සිටින ආර්මේනියාව ද, සිය ස්ථාවරය ප්‍රකාශයට පත් කොට නැත. රුසියාව මත ආර්ථික හා දේශපාලන වශයෙන් අධික ලෙස යැපෙන ආර්මීනියාව එවැනි තීරනයක් ගත හොත්, එය අසර්බයිජානය මොස්කෝවෙන් ඈතට තල්ලු කිරීමට හේතු වනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් කැස්පියානු හා කොකේසියානු කලාපවල දේශපාලන සබඳතාවල සමස්ත හැඩහුරුවෙහි ම තියුනු වෙනස්වීම් ඇති කිරීමට මං පෑදෙනු ඇත. රුසියාවට වාසිදායක ව්‍යාපෘති එක්සත් ජනපදයට හා යුරෝපයට වඩාත් වාසිදායක ව්‍යාපෘති හා තරග වදින කොන්දේසි යටතේ තෙල් හා ගෑස් නල මාර්ග සැලසුම්වලට ද එය බලපානු ඇත.

කොසෝවෝව සම්බන්ධයෙන් යුක්රේනයෙහි නිශ්ශබ්දතාව ද අවබෝධ කර ගත හැකිය. රුසියානු ගෑස් බටහිරට ප්‍රවාහනය කිරීම හා නේටෝවට ඇතුලුවීමේ එහි සැලසුම් සම්බන්ධයෙන් ද යුක්රේනය රුසියාව සමග උග්‍රවන ආතතීන්ට මුහුන දේ.

යුක්රේනියානු ජනාධිපති වික්ටර් යුෂ්චෙන්කෝ සමග පෙබරවාරි 11 දින පවත්වන ලද පුවත් පත් සාකච්ඡාවක දී යුක්රේන් දේශයට එරෙහිව මිසයිල ප්‍රහාරයක සම්භාව්‍යතාව ගැන පුටින් විවෘත තර්ජනයක් නිකුත් කලේ ය.

යුක්රේනයේ කටයුතුවලට රුසියාව මැදිහත් නොවන බවත් සිය ස්වාධීනත්වයට සීමා ඇති කිරීමට යුක්රේනයට අවශ්‍යනම් එය යුක්රේනයට අයත් කටයුත්තක් ලෙස සලකන බවත් පුටින් ප්‍රකාශ කලේ ය. එසේ වුව ද, යුක්රේනයෙහි නේටෝවේ හමුදා කඳවුරු ඇතිවීමේ ඉදිරිදර්ශනය ඉදිරියේ - නිදසුනක් වශයෙන් සෙවැස්ටොපොල්හි - ඊට එදිරිව ප්‍රමානවත් පියවර ගැනීමට රුසියාවට සිදුවනු ඇතැයි ද ඔහු වැඩි දුරටත් කීය.

"රුසියාව සිය මිසයිල පද්ධතිය යුක්රේනය ඉලක්ක කොට ගනු ඇතැයි කීමට පමනක් නොව, සිතීමට පවා බිහිසුනු යැයි පුටින් පැවසීය.

සාමයට හා අසල්වැසි සබඳතාවලට කැපවීම සම්බන්ධයෙන් කරන ලද නිල ප්‍රකාශන දුසිම් ගනනකට වඩා, නොවලහා කරන ලද මේ තර්ජනය පශ්චාත්-සෝවියට් දේශයන්හි සබඳතාවල සැබෑ ස්වරූපය බොහෝ සෙයින් විදහා දක්වයි.

1990 ගනන්වල කලින් තිබූ සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයෙහි පිපිරුනු අන්තර්-රාජ්‍ය හා ජනවාර්ගික යුද්ධ වෙනුවෙන් ලබාගතහැකි දත්ත අනුව ලක්ෂගනන් ජීවිත බිලිවිය. දස ලක්ෂ සංඛ්‍යාත ජනකායකට තම නිවෙස් අහිමි විය. නැත්නම්, තම නිවාසවලින් ඉවත්ව යැමට සිදුවිය.

මේ විනාශකාරී ක්‍රියාවලියෙහි ප්‍රතිඵල මෙතෙක් තවමත් මැඩ පවත්වාගෙන නැත. ධනවාදී ප්‍රතිසංස්කරන ප්‍රතිපත්තිවල රාමුව තුල ක්‍රියාත්මක වීමෙන් ඒවා මැඩපැවැත්විය ද නොහැක. මේ ප්‍රතිපත්ති මූලික වැදගත්කමක් පවරන්නේ ජනයාගේ වාස්තවික අවශ්‍යතාවයන්වලට නොවේ. බහුතරයේ අවශ්‍යතාවන්ට අනුකූලව ආර්ථිකය තර්කාන්විතව සංවිධානය කිරීමේ ඉලක්කය කරාද නොවේ. මේ ප්‍රතිපත්ති සපුරාලන්නේ නව පාලක ප්‍රභූවේ අනුන් ගොදුරු කර ගන්නා අභිලාෂයන් පමනි. මේ නව පාලක ප්‍රභූව ජනිත වූයේ පැරනි සෝවියට් ස්ටැලින්වාදී නිලධාරි තන්ත්‍රයෙහි උරුමක්කාරයින් ලෙසය. මේ නීච පාලක ප්‍රභූව තම තමන්ගේ රටවල ස්වාභාවික හා ආර්ථික සම්පත් පරපුටුවන් ලෙස කොල්ලකයි.

මේ එක් එක් පාලක කල්ලිය තනි තනිව ම ලෝක අධිරාජ්‍යවාදයේ ප්‍රධාන බලවතුන් සමග හා ජාතික මායිම් ඉක්මවූ සංස්ථාවල නායකයින් සමග ඍජු සබඳතා ස්ථාපිත කිරීමට උත්සාහ දරයි. සෝවියට් ඉතිහාසයේ දශක ගනනාවක් තුල එක් රැස් කරන ලද සියල්ල සොරාගැනීමේ කාර්යයෙහි මේ පාලක කල්ලි දිගින් දිගට ම යෙදී සිටිත්. එමගින් ඔවුහු ඉතිරිවී ඇති සමාජමය වාසි විනාශ කරති. සිය රටවල කම්කරු පන්තිය හා වැඩ කරන අනිකුත් ස්තරයන් අනුකම්පා විරහිතව සූරාකති.

කලින් තිබූ සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයෙහි දේශයන්හි තම බලපෑම ශක්තිමත් කිරීමට මහා බලවතුන් දරන්නා වූ උත්සාහයන් ද තමන්ට අහිමි වූ ඇතැම් ස්ථාවරයන් පිරිමසාලීමට රුසියාව දරන්නා වූ ප්‍රයත්නයන් ද නව හා ලේ තැවැරුනු ගැටුම් ඇති වීමට තර්ජනය කරයි.

© www.wsws.org